# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 35 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 08/01/2024

පැය 1045

## මාධ්‍ය නිවේදනය

**<u>පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරිම.</u>**

**01. 2024.01.07 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරින් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 11 | 11 | 274 | 1625 | තඹ දඟර 02<br>බැරල් 10<br>බූලි 02 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථාන වෙත ඉදිරිපත් කර ඇත.

**02. ගංජා හේනක් වටලා සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා උඩවලව කඳවුර.**

2024.01.07 වන දින සවස් කාලයේ තණමල්විල පොලිස් වසමේ කිවිල්ආර ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා උඩවලව කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **නීති විරෝධි ලෙස වගා කර තිබූ ගංජා ගස් 4646ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන තණමල්විල පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 30 ක් වූ තණමල්විල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. තණමල්විල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. නීති විරෝධි ලෙස ට්‍රැක්ටර් රථ 03කට වැලි පටවමින් සිටි සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අරන්තලාව කඳවුර**

2024.01.07 වන දින දහවල් කාලයේ මංගලගම පොලිස් වසමේදී පොලිස් විශේෂ කාර්ය බලකා අරන්තලාව කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **නීති විරෝධි ලෙස ට්‍රැක්ටර් රථ 03කට වැලි පටවමින් සිටි සැකකරුවන් තිදෙනෙකු එම ට්‍රැක්ටර් රථ 03 ද සමග** අත්අඩංගුවට ගෙන මංගලගම පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 30 හා 34 වයස් වල පසුවන ගලහිටියාගොඩ හා මංගලගම ප්‍රදේශවල පදිංචිකරුවන් වේ. මංගලගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**04. බලපත්‍ර නොමැතිව ට්‍රැක්ටර් රථයකින් වැලි ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා නෙල්ලිඅඩි කඳවුර.**

2024.01.07 වන දින දහවල් කාලයේ කොඩිකාමම් පොලිස් වසමේ කෙප්පේලි ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා නෙල්ලිඅඩි කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **බලපත්‍ර නොමැතිව ට්‍රැක්ටර් රථයකින් වැලි ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන කොඩිකාමම් පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 31ක්වූ පලාලිය උතුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. කොඩිකාමම් පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.